# සීමා

පණ්ඩිත වැලිගම ඤාණරතන ස්ථවිර

සීමා නම් ඉමයි. භික්ෂු සංඝයා වහන්සේගේ විනය කර්මයන් කිරීම පිණිස බුදුරජාණන් වහන්සේ විසින් පණවන ලද ක්‍රමය අනුව වෙන් කොට ගනු ලබන ප්‍රදේශය මෙහිලා සීමා නමැයි හඳුන්වනු ලැබේ. බුදුසසුන නොනැසී පවත්වා ගෙන යාමට සීමාව තරම් උපකාර වන්නාවූ අන් කිසි තැනක් නොමැත.

**සීමාවක් අනුදැනීම :**

''සමගි සංඝයාගේ උපොසථ කර්මය අනුදනිමි''යි භාග්‍යවතුන් වහන්සේ පණවා වදාළ කල්හි ''සංඝයා පිළිබඳ ඒ සමගිය කෙතෙක් දුර විහිදී යන්නක්ද? එක් ආවාසයක්ද? නැතහොත් මුළු පොළොවේ''දැයි භික්ෂූහු බුදුරදුන් විමසූහ. එවිට බුදුරජාණන් වහන්සේ **''අනුජානාමි භික්ඛවෙ එත්තාවතා සාමග්ගි යාවතා එකාවාසො''** මහණෙනි එකා වාසය යම්තාක්ද, සමගිය එපමණයැයි වදාළ සේක. ඉන්පසු එකා වාසය කොපමණකින් වන්නේ දැයි විචාළ විට **''අනුජානාමි භික්ඛවෙ සීමා සම්මන්නිතුං''** මහණෙනි සීමාව සම්මත කරන්නට මම අනුදනිමි''යි සීමාව අනුදැන වදාළ සේක.

**සීමා ප්‍රභෙද :**

ප්‍රධාන වශයෙන් සීමා දෙකකි. ඒ බද්ධ සීමා අබද්ධ සීමා වශයෙනි. බද්ධ සීමා නම් එකොළොස් විපත්ති සීමාවන් දුරුකොට ත්‍රිවිධ සම්පත්තියෙන් යුතු කොට, නිමිත්තෙන් නිමිත්ත ගලපා බුද්ධ දෙශිත කර්ම වාක්‍යයෙන් සම්මත කරනු ලබන සීමාවයි. එහිලා එකක් පාසා විස්තර මෙසේය.

1. **අතිඛුද්දක සීමාව :**

මේ එකොළොස් විපත්ති සීමාවන් අතර පළමු වැන්නයි. ඉතා කුඩා සීමාවයි. යම් සීමාවක් තුළ යටත්පිරිසෙයින් භික්ෂූන් වහන්සේ එක්විසි නමකට වත් පරිමණ්ඩලාකාරයෙන් වැඩහිඳින්නට නො පිළිවන්නම්, එය විනය කර්ම කිරීමට කැප නො වන්නාවූ අති ඛුද්දක සීමාවයි. සංඝයා වැඩිම සංඛ්‍යාවක් අවශ්‍ය වනුයේ අබ්භාන කර්මයටයි. අබ්භානාරහ (අබ්භානයන සුදුසු) භික්ෂුවටත් එම කර්මය අඩුගණනේ විසිනමක් සංඝයාගේ සහයෝග යෙන් කළයුතු හෙයින් ඒ විසිනමක් භික්ෂූන් වහන්සේටත් පරිමණ්ඩලාකාරයෙන් හිඳ ඒ කර්මය කිරීමට එම සීමාව තුළ ඉඩ නොමැති නිසා නො පිළිවන් හෙයින් එය විනය කර්ම පිණිස අයොග්‍යය. එහිදී කරනු ලබන විනය කර්ම සාර්ථක නොවනුයේ සීමාව ඉතා කුඩා බැවිනි. එබැවින් එය විපත්ති සීමාවකි.

**අති මහති සීමා :**

ඉතා විශාල සීමාවයි. යොදුන් තුනකට කෙසහක් පමණ හෝ වැඩිනම් එයයි. සීමාවක් යොදුන් තුනකට වැඩි නොවිය යුතුයි.

**ඛණ්ඩ නිමිත්ත සීමා :**

නොගටන ලද නිමිති ඇති සීමාවයි. පෙරදිග නිමිත්ත කීර්තනය කොට පුරත්ථිම අනුදිසායෙහිය, දකුණු දිසායෙහිය යන මේ ක්‍රමයෙන් නිමිති කීර්තනය කැරගෙන ගොස් උතුරු අනුදිසාවෙහි නිමිත්ත කීර්තනය කොට මුලින් කීර්තනය කළ පුරත්ථිම දිසායෙහි නිමිත්ත නැවත කීර්තනය කිරීමෙන් පසු උතුරු අනුදිසායෙහි නිමිත්තෙන් පෙරදිග නිමිත්ත ගැලපුණේ වෙයි. එසේ නොකොට උතුරු අනුදිශායෙහි නිමිත්ත කීර්තනය කොට එයින් නැවතුනේ නම් හෝ ඉන් මොබ නැවතුනේ නම් හෝ එය ඛණ්ඩ නිමිත්ත නම් වේ. එසේම නිමිත්තූපග නොවන නිමිති ගත් කල්හිද ''ඛණ්ඩ නිමිත්ත සීමා'' යයි හැඳින්වේ.

4. **ඡායා නිමිත්තා:**

පර්වත ගස් ආදියේ සෙවනැල්ල නිමිති වශයෙන් ගෙන සම්මත කිරීමයි.

5. **අනි මිත්තා:**

සර්වප්‍රකාරයෙන්ම නිමිති කීර්තනය නොකොට සම්මත කරනලද සීමාවයි.

6. **බහි සීමෙ ඨිත සම්මතා:**

නිමිති කීර්තනය කොට ඉන්පසු ඒ නිමිතිවලින් පිටත හිඳ සම්මත කරන ලද සීමාවයි. කීර්තනය කරන ලද නිමිති ඇතුළත හිඳ සම්මත කරන ලද්දී සුසම්මත සීමාවයි.

7. **නදියා සම්මතා:**

ගොඩබිමෙහි සේ ගඞ්ගායෙහි කර්ම වාක්‍ය භණනයෙන් සම්මත කිරීමයි.

8. **සමුද්දෙ සම්මතා:**

මුහුදෙහි කර්ම වාක්‍ය භණනයෙන් සම්මත කිරීමයි.

9. **ජාතස්සරේ සම්මතා:**

ස්වයංජාත විල් ආදියෙහි කර්ම වාක්‍ය ගණනයෙන් සම්මත කිරීමයි.

**10. සීමාය සීමං සම්භින්දන්තෙන සම්මතා:**

ස්වකීය සීමායෙන් මෙරමාගේ සීමාවේ කොටසක් ගෙන සම්මත කිරීමයි. අතු පැටලී ගිය අඹ දඹ යන ගස් දෙකක් සමීපයෙහි පැරණි විහාරයක් තිබේ නම්, එහි දඹ ගස සීමාවට ඇතුල්කොට, අඹ ගස නිමිත්ත වශයෙන් ගෙන, සීමාවක් සම්මත කොට තිබෙනවිට, පසුව අන් කෙනෙක් අඹ ගස සීමාවට ඇතුල්කොට දඹ ගස සීමා නිමිත්ත වශයෙන් ගෙන සම්මත කෙරෙද්දී, එය ස්වකීය සීමාවෙන් මෙරමාගේ සීමාව සමභින්දනය කෙරෙමින් සම්මත කරන ලද්දක් වන්නීය.

**11. සීමාය සීමං අජ්ඣොත්තරන්තෙන සම්මතා:**

ස්වකීය සීමාවෙන් මෙරමාගේ සීමාවේ ප්‍රදේශයක් හෝ සම්පූර්ණයෙන් හෝ යටකොට සම්මත කිරීමයි. මොව්හු එකොළොස් විපත්ති සීමාවෝය.

**ත්‍රිවිධ සම්පත්ති**

නිමිත්ත සම්පත්ති, පරිස සම්පත්ති කම්මවාචා සම්පත්ති විසින් දක්වෙන සම්පත් තුන සම්පූර්ණ වීමෙන් සීමා සම්පත්තිය සඵල වේ. එහි **නිමිත්ත සම්පත්තිය නම්:**

අටවැදෑරුම් නිමිත්තූපග (නිමිති වශයෙන් ගත යුතු) දෙයින් යම් කිසිවක් ගැනීමයි. එහිලා ගැනෙන 1. **පබ්බත නිමිත්ත** නම් ශුද්ධ පංසු පර්වතය නම් (තනි පස් පමණක් ඇති පර්වතය) ශුද්ධ පාසාණ (තනි ගල්) පර්වතය, පස් ගල් යන දෙකින් මිශ්‍ර පර්වතය කියා ත්‍රිවිධය. මෙය නිමිත්තූපග වීමට නම් ඇතෙකු තරම්වත් උස පර්වතයක් විය යුතුයි. ඉතා කුඩා වූ පර්වතය නොවටී. 2 **පාසාණ නිමිත්ත**ට ගැනෙන්නේ ඇතෙකුට කුඩා වුද, පලම් දෙතිසකට වැඩි වුද පාසණයකි. 3 වන **නිමිත්ත** වනුයේ හරය තිබෙන ගස් හතරක් පහක්වත් ඇති වනයයි. 4. **රුක්ඛ නිමිත්ත** වශයෙන් අරටුව ඇති ජීවත් වන්නාවූ වෘක්ෂයෝම ගැනෙති. ඒ ගස් යටත්පිරිසෙයින් අටඟුලැති පන්හිඳක් තරම්වත් විය යුතුය. 5. **මග්ග නිමිත්ත**ට අයත් වනුයේ පා ගමනින් හෝ රිය ගමනින් යා හැකි වූ ගම් දෙකක් තුනක්වත් ඉක්මවා යන මඟකි. 6 **වම්මික නිමිත්ත** නම්; යටත්පිරිසෙයින් අටඟුල් ගව අඟක් පමණැති එදවසැ හෝ බැඳි තුඹසකි. 7. **නදී නිමිත්ත නම්:** ගංගාවක් නිමිති වශයෙන් ගැනුමය. 8. **උදක නිමිත්ත නම්:** ගලා නො බස්නා ලිං පොකුණු සහ කණින ලද වල්හී ඒ අවස්ථාවට කලින් ගෙනත් පුරවන ලද ජලය හෝ කර්ම වාක්‍ය දෙශනා කොට අවසන් වනතුරු සහමුලින් නොසිඳී ස්වල්පයක්වත් රඳා පවත්නේ නම්, ඒ ජලයයි.

**2. පරිස සම්පත්ති**

අන්තිම පරිච්ඡෙදයෙන් භික්ෂූන් වහන්සේ සිවු නමක් සීමා සම්මතය පිණිස අවශ්‍ය වන්නේය. එම ග්‍රාම ක්ෂේත්‍රයෙහි වෙසෙන තාක් උපසපන් භික්ෂූන් වහන්සේද එම අත්පසට එළඹ විනය කර්මයට සහභාගිවීම හෝ, යම් හෙයකින් සීමා සම්මතයට නොපැමිණෙන භික්ෂූන් වහන්සේ වෙත් නම්, උන් වහන්සේලා බද්ධ සීමාවෙක්හි හෝ, නදී-සමුද්ද-ජාතස්සරයන් අතුරින් තැනක බැස හෝ, සීමා සම්මතය අවසන් වනතුරු විසිය යුතුය. අසනීපාදී යම් අපහසුකමක් වේ නම්, ඡන්දය දී එම ග්‍රාම ක්ෂේත්‍රයෙහි විසිය හැකිය. සීමා සම්මතයක් සංඝ කර්මයක් බැවින් ඒ සීමා සම්මත සංඝ (විනය) කර්මය කිරීම පිණිසද සීමාවක් අවශ්‍ය වන හෙයින්, මේ කියන ඒ බද්ධ සීමා සම්මත විනය කර්මය සිදු කරන්නේ ග්‍රාම සීමාවේ පිහිටා සිටීමිනි. මෙහිදී ග්‍රාමය (ගම) වශයෙන් ගැනෙන්නේ එක් මුලාදෑනි වසමකි. ඉහත සඳහන් ලෙස එම මුලාදෑනි වසමේ වෙසෙන තාක් සියලු භික්ෂූන් වහන්සේගේ කැමැත්ත - සහයෝගය ඇති කල්හි පරිස සම්පත්තියෙන් යුක්තය.

**3. කම්මවාචා සම්පත්ති**

නිමිත්ත කීර්තනයෙන් පසු ව්‍යක්ත ප්‍රබල භික්ෂූන් වහන්සේ විසින් ''සුණාතු මෙ භන්තෙ සංඝො, යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා යදි සංඝස්ස පත්තකල්ලං, සංඝො එතෙහි නිමිත්තෙහි සීමං සම්මන්නෙය්‍ය, සමාන සංවාසං එකූපොසථං, එසාඤත්ති සුණාතු මෙ භන්තෙ සංඝො යාවතා සමන්තා නිමිත්තා කිත්තිතා, සංඝො එතෙහි නිමිත්තහි සීමං සම්මන්නති, සමාන සංවාසං එකූපොසථං, යස්සායස්මතො ඛමති, එතෙහි නිමිත්තෙහි සීමාය සම්මුති, සමාන සංවාසාය එකූපොසථාය, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය, සම්මතා සා සීමා සංඝෙන එතෙහි නිමිත්තෙහි සමාන සංවාසා එකූපොසථා ඛමති සංඝස්ස, තස්මා තුණ්හී, එව මෙතං ධාරයාමි'' යන ඤත්ති දුතිය කර්ම වාක්‍යය සුපරි සුද්ධ ලෙස දේශනා කිරීමෙන් සම්මත කිරීමයි. ඛණ්ඩ සීමා, සමාන සංවාස සමා, අවිප්පවාස සීමා, යන සීමාවෝ බද්ධ සීමාවේම ලැබෙන භෙදයෝය. එහිලා මධ්‍යස්ථවම්හ.

මෙසේ සමාන සංවාස සීමාව සම්මත කොට ඉන්පසු තිචීවරෙන අවිප්පවාස සීමා ව සම්මත කටයුතුයි.

**1. සීමා සමූහනය**

සීමා සමූහනය යනු පෙර සීමාවක් තිබුණේ නම්, එය අවලංගු කිරීමය. පෙර සම්මත කරනලද සීමාවක් ඇද්ද නැද්ද යනු නිශ්චය වශයෙන් නොදන්නා හෙයින්, පළමු කොට සීමා සමූහනය කිරීම අද සිරිතය. එහිදී ප්‍රථම කොට තිචීවරෙන අවිප්පාවාස සීමාව සමූහනය කළ ඉක්බිති, සමාන සංවාස සීමාව සමූහනය කළ යුතුය. නිමිති කීර්තනය කොට සීමා සම්මතය සිදු කිරීම ඉන්පසුව කළයුතුය.

**2. අබද්ධ සීමා**

1. ගාම සීමා 2. සත්තබ්භන්තර සීමා 3. උදකුක්ඛෙප සීමායි තුනකි. එහි ගාම සීමා නම් එක

මූලාදැනි වසමකට අයත් පෙදෙසයි. නිගම නගර යන මේවාද මීටම අයත්ය. ගමෙහි හෝ නිගමයෙහි හෝ නගරයෙහි හෝ ග්‍රාම භෝජකයෝ (ගමු මූලාදැනිහු) අයබදු ලබත් නම්, කුඩාවූ හෝ මහත් වූ හෝ ඒ ප්‍රදේශයම ග්‍රාම සීමාවට අයත්ය. සීමා සම්මත විනය කර්මය කරනුයේ මෙකී ග්‍රාම සීමා වෙහිය. එවිට ගම්-නියම් ගම්-නගර යන කොතනින් හෝ සීමා සම්මතයක් කරතත්, ඒ ඒ ගම් නියම් ගම් නගරයෝ ඒ විනය කර්මයනට සීමා වෙති. ඒ සීමා සම්මත ගමේ නම් ගම්වාසි භික්ෂූහුද. නගරයේ නම් නගරවාසි භික්ෂූහුද, අත් පසට පැමිණිය යුතුය. යම් ගමක හෝ නියම් ගමක හෝ නගරයක හෝ කොටසක් වෙන් කොට රජතෙමේ දෙන්නේ නම් එය "විසුං ග්‍රාමයෙකි" එයද ග්‍රාම සීමාවක්ය. මෙසේ ගම්, නියම් ගම්, නගර, විසුංගාම, යන කොහි වුවත් භික්ෂූහු එකම අත්පසට පැමිණීමම විනය කර්මාරහ වූ ග්‍රාම සීමාවක් වීමට හේතුය.

2. සත්තබ්භන්තර සීමා

වින්ධ්‍යාටවී ආදී වනයන්හිද මස් මරන්නන්ට යා නොහැකි මුහුදු දිවයින් වලත්, මෙ සීමාව ලැබේ. එහි මැද භික්ෂූන් හුන් කල්හි හැම පසින්ම අබ්භන්තර හතක් තැන් මෙය පැතිර යන්නේය. භික්ෂූන් වහන්සේ වැඩිවන තරමට සීමාවත් මහත් වන්නේය. භික්ෂූන් වහන්සේ හිඳ ගත් ප්‍රදේශය හැර මෙකී අබ්භන්තරයෝ ගැනෙති. එක අබ්භන්තරයක් විසි අට රියනකි. එම වනයේ හෝ දූපත්වල කොතැනක හෝ සංඝයා විනය කර්ම කෙරෙත් නම්, ඒ සත්තබ්භන්තර සීමා දෙකට මැද එක සත්තබ්භන්තරයක් වත් උපචාරය සඳහා තිබිය යුතුය.

3. උදකුක්ඛෙප සීමා

ගං , හෝ - මුහුදු ජාතස්සර යන යම් කිසිවකු මධ්‍යම ප්‍රමාණ පුරුෂයකු දදු ක්‍රීඩකයෙකු දදු කැට දමා ගසන්නාක් මෙන්, වැලි හෝ දිය මුළු ශක්තිය යොද විසි කළවිට ඒවා වැටෙන තැනින් ඇතුළු ප්‍රදේශය උදකුක්ඛෙප නමි. පෙර කී සේ වැලි හෝ දිය විසි නොකළත් සංඝයා රැස්ව සිටි යම් ලෙසකින් ඒ දිය හෝ වැලි විසිකළොත් වැටෙන ප්‍රමාණයෙන් ඇතුළත්හිවූ ප්‍රදේශය උදකුක්ඛෙප සීමාවට අයත් වන බවද, අර්ථකථා ගත මතයකි. වැසි සාර මස තුළ වැසි ජලය නොසිඳී පවත්නා කල්හි භික්ෂුණියක සේඛියාහිකී ලෙස තෙමඩුලු වසා සිවුරු හැඳ පෙරවැ, අඳනය ඔසවා නොගෙන, එකී වැසි දියෙන් ගොඩ වෙත්ම ඒ භික්ෂුණියගේ අඳනය අඟලක් පමණවත් තෙමේ නම්, ඒ දිය ගලා බැස්සත් නැතත්, එය නදී සංඛ්‍යාවට වැටේ. ස්වයංජාත වූ සොබ්භය (හෙබ) වැසිදිය වැටී පවතින තැනකි, ගංගාවකින් හෝ මුහුදෙන් හෝ සිදුරු කොට කනින ලද සොබ්භයත් ජාතස්සර සංඛ්‍යාවට අයත් වේ. නදියෙහි හෝ ජාතස්සරයෙහි හෝ ප්‍රකෘති වර්ෂා කාලයෙහි වූ සිව් මස දිය රඳා පවත්නේ නම්, නියන් සමයෙහි ඒ දිය සිඳී ගිය ද, එය විනය කර්මාරහ කප්පිය භූමියකි. එබඳු යම් බිමෙක්හි නියං සමයයෙහි ගොවිතැන් ආදිය කෙරේ නම්, එය අකැප බිමෙකි. මුහුදු රැළයක් ගැසූ විට ඒ දිය නොසිඳී රඳා පවත්නා තාක් කල් විනය කර්මාරහ කප්පිය භූමියෙකි. ගංගා ආදියෙහි සංඝයා දෙතැනක පොහොය කරන විට එක උදකුක්ඛෙපයක් උපචාරය පිණිස හළ යුතුය. උදකුක්ඛෙපය සීමාවද සත්තබ්භන්තර සීමාව සේ සංඝ පිරිස වැඩිවූ තරමට පැතිර ගෙන යන්නිය. මෙසේ සීමා වශයෙන් පිළිසිඳින ලද ප්‍රදේශය තුළ වූ සියලු භික්ෂූන් වහන්සේ අත් පසට වන් කල්හි විනය කර්මයට සුදුසු වන්නේය. සීමාව වූ කලී ශාසනාරක්ෂාව සඳහා අන් හැම තැනකටම වඩා ප්‍රයෝජනවත්ය.

> න හොති භික්ඛු භවොසො
> උප සම්පත්තියා විනා
> න හොති උපසම්පත්ති
> සීමා සම්පත්තියා විනා

උපසම්පදාවෙන් තොර වූ භික්ෂුත්වයක් නැත. සීමා සම්පත්තියෙන් තොර උපසම්පදාවක් ද නැත. මේ අනුව සසුන් බඹසර රක්නවුනට සීමාව තරම් ප්‍රයෝජනවත් අන් බිමෙක් නැත.